සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

50 | S | I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 10 - 2019

නම : ............................................... නාට්‍ය හා රංග කලාව - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

I පහත දැක්වෙන පද්‍ය හා සංවාද ඇසුරෙන් අංක 1 - 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පුරසඳ පායා දිලෙන වැනි - මූණ තිගේ
දිලෙන වැනි මුහුණ තිගේ
සීදේවි මාගේ කිට්ටු වෙයන්කෝ

B - අග්නි අසනිය දෙවියනේ
වැහි වලාහක දෙවියනේ
මේඝ ගර්ජන දෙවියනේ
බලන් මට කළ මේ විනේ

C - ගුරු - මම ළඟ සතයක්වත් නැහැ
බමුණා - අට්ඨ පනම් දේහි
ගුරු - ඔන්න රා බොන්නද කොහෙද පනම් අටක් ඉල්ලනවා
බමුණා - ඉමං මනුස්සානං යක්ෂ දෝසං අස්ථි

D - උගෙ කාරිය ඌ පැලපොල් වනසනවා
මගෙ කාරිය මම පැලපොල් සිටුවනවා
සිතු කාරිය සිතු දේ සාදා දෙනවා
උඩුවේරිය දෙවි ඌරට හෙන දෙනවා

1. කොහොඹා කංකාරියට අයත් පද්‍යයෙහි අක්ෂරය වන්නේ
(1) B (2) C (3) A (4) D

2. නාඩගම් සම්ප්‍රදාය හා නාට්‍ය ධර්මී රංග ශෛලියට අනුගතව රචනා කර ඇති නාට්‍යයක කොටසක් වන්නේ
(1) A (2) C (3) B (4) D

3. පහතරටට ආවේණික ශාන්ති කර්මයක් වන මැණික් පාල ශාන්තියට අදාළ සංවාද ඛණ්ඩය අන්තර්ගත වන්නේ
(1) B (2) A (3) D (4) C

4. හෙන්රි ජයසේන මහතාගේ නාට්‍යයට අදාළ ගීත ඛණ්ඩය වන්නේ
(1) A (2) C (3) B (4) D

5. පුණ්‍යසේන ගුණසිංහයන් සංගීතය සැපයූ නාට්‍ය ගීත කොටස අන්තර්ගත වන්නේ
(1) C (2) B (3) D (4) A

6. නාට්‍යයක ගැටුම යනු,
(1) කුතුහලය මතුවන අවස්ථාවටයි
(2) දෙපිරිසක් අතර ඇතිවන බහින් බස් වීමයි
(3) බලවේග දෙකක් ගැටී තීරණයක් ගත නොහැකි අවස්ථාවයි.
(4) නාට්‍යයේ සියල්ල සමතයකට පත්වන අවස්ථාවයි

7. නාට්‍ය පසුබිම යනුවෙන් හඳුන්වනුයේ
(1) කතාවක සිදුවන සියල්ලටයි (2) කතාවක රසය මතු කිරීමයි
(3) කතාව සිදුවන ස්ථානයයි (4) නාට්‍ය රඟ දක්වන අවස්ථාවේ වේදිකා පසුබිමයි

8. ශ්‍රව්‍ය දෘශ්‍ය කලා මාධ්‍යයන් අඩංගු නොවන පිළිතුර වන්නේ
(1) චිත්‍රපට, රූපවාහිනී නාට්‍ය, බැලේ, මුද්‍රා නාට්‍ය (2) චිත්‍රපට, ඔපෙරා, කාටූන්, මුද්‍රානාට්‍ය
(3) බැලේ, මුද්‍රානාට්‍ය, ඔපෙරා, කාටූන් (4) චිත්‍ර, චිත්‍රපට, බැලේ, කාටූන්

9. නෘත්‍ය යනු,
(1) හුදු නර්තනයයි
(2) සතර අභිනයම යොදා ගත්තකි
(3) ආංගික, සාත්වික, ආහාර්ය, අභිනය යොදාගත් නැටුමකි.
(4) අර්ථයක්, භාවයක් දක්වෙන තාලාන්විත නැටුමයි

10. නළුවන් පුහුණුවීමේ දී ප්‍රගුණ කළ යුතු අංශ 2 නම්
(1) සිත හා ශරීරය (2) ශරීරය හා කටහඬ
(3) සිත ශරීරය හා කටහඬ (4) සිත හා කටහඬ

11. රංග ක්‍රීඩා කිරීමෙන් ලැබෙන ප්‍රයොජනයක් නොවේ.
(1) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ඇතිවීම (2) ජය පරාජය විඳ දරා ගැනීම
(3) අවදානම් ක්‍රියාවල යෙදීම (4) අවධානය, අවදානම අවධාරණය කිරීම

12. වචන නිරවුල් ව පැහැදිලි ව ප්‍රකාශ කිරීම සම්බන්ධ රංග අභ්‍යාසය වන්නේ,
(1) ශිථිලීකරනා අභ්‍යාස (2) චිත්ත ඒකාග්‍රතාව ඇති කරන අභ්‍යාස
(3) දිව සම්බන්ධ සංවේදන අභ්‍යාස (4) ශ්වසන අභ්‍යාස

13. දික්තල කාලගෝල නාට්‍යයට අදාළ නාට්‍ය ගීතයක් නොවේ.
(1) අපි ගමට යමු... (2) හිටපල්ලා හිටපල්ලා නොගොහින්
(3) අම්බරයේ සඳසේ... (4) ගල්ලෙන බිඳලා

14. දික්තල කාලගෝල නාඩගම රචනා කරන ලද්දේ
(1) සිරි ගුණසිංහ (2) පුණ්‍යසේන ගුණසිංහ
(3) චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ (4) එදිරිවීර සරච්චන්ද්‍රයන්

15. රටයකුම, සන්නියකුම, සූනියම් යාගය යන ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ පිළිවෙළින් දක්වෙන වරණය අඩංගු පිළිතුර වන්නේ
(1) නානුමුරය, වඩිග පටුන, දහඅට සන්නිය (2) දහඅට සන්නිය, නානුමරය, වඩිග පටුන
(3) වඩිග පටුන, නානුමරය, දහඅට සන්නිය (4) නානුමරය, දහඅට සන්නිය, වඩිග පටුන

I අංක 16 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර පහත වගුව ඇසුරෙන් සපයන්න.

| ක | ග | ට | ජ | ඩ |
|---|---|---|---|---|
| ස්වර්ණ හංස<br>ස්වර්ණමලී<br>දියසේන<br>නොපැමිණීම | සෙක්කුව<br>විනිශ්චය<br>උත්තමාවි<br>වරෙන්තුව | බෝඩිං කාරයෝ<br>මුතු කුමාරි<br>නන්දි විසාල<br>සත සහ සත | මනාලයෝ<br>වැදගත්කම<br>පව්කාරයෝ<br>අහස්මාළිගා | පුස්ලොඩං<br>සුදු සහ කළු<br>සුභ සහ යස<br>පණ්ඩුකාභය |

16. බන්දුල ජයවර්ධන නාට්‍ය කරුවාගේ නාට්‍ය දැක්වෙන තීරය වන්නේ
(1) 'ජ' ය (2) 'ග' ය (3) 'ට' ය (4) 'ක' ය

17. සුගතපාල ද සිල්වා මහතාගේ නාට්‍ය දැක්වෙන තීරය වන්නේ
(1) 'ක' ය (2) 'ට' ය (3) 'ජ' ය (4) 'ඩ' ය

18. ජංගම රග' මඩල ආරම්භ කිරීමට පුරෝගාමී වූ නාට්‍ය කරුවෙක්ගේ නාට්‍ය සම්බන්ධ තීරය වන්නේ
(1) 'ක' ය (2) 'ජ' ය (3) 'ග' ය (4) 'ඩ' ය

19. සයිමන් නවගත්තේගම මහතාගේ නාට්‍ය දැක්වෙන තීරය වන්නේ
(1) 'ග' ය (2) 'ජ' ය (3) 'ඩ' ය (4) 'ට' ය

20. හෙන්රි ජයසේන මහතාගේ නාට්‍ය දැක්වෙන තීරය වන්නේ
(1) 'ක' ය (2) 'ජ' ය (3) 'ග' ය (4) 'ට' ය

21. ජන කරළිය/ජංගම රගමඩල ඇරඹූ ශිල්පීන් වනුයේ
(1) පරාක්‍රම නිරිඇල්ල, සුගතපාල ද සිල්වා (2) බන්දුල ජයවර්ධන, සුගතපාල ද සිල්වා
(3) පරාක්‍රම නිරිඇල්ල, එච්. ඒ. පෙරේරා (4) බන්දුල ජයවර්ධන, එච්. ඒ. පෙරේරා

22. නිශ්චිත (ගණිතමය) රටාවකට අනුව බෙදා වෙන් කළ ක්‍රමයකට අනුව කරනු ලබන චලන හඳුන්වන්නේ
(1) ස්වාභාවික චලන (2) නිර්මිත චලන (3) සංචලන (4) තාලානුකූල චලන

23. නාට්‍යමය ලක්ෂණයක් නොවේ.
(1) අනුකරණය (2) අවස්ථා නිරූපණය (3) අනුරූපණය (4) අනුවර්තනය

24. එකම ළමයකුට උරුමකම් කියන කාන්තාවන් දෙදෙනෙකු හා කිසිවකු අපේක්ෂා නොකළ පරිදි නඩුව විසඳන විනිසුරුකරුවකු සම්බන්ධ ව අපූර්ව කතා පුවතක් සහිත නාට්‍යය වන්නේ,
(1) මනමේ (2) කුවේණි (3) හුණුවටයේ කතාව (4) අපට පුතේ මඟක් නැතේ

25. ශෛලිගත සම්ප්‍රදායෙන් දෛනික ජීවන ප්‍රශ්න නාට්‍යයට නැංවීම දුෂ්කර යැයි පැවති මතයට පිළිතුරක් ලෙස නිපදවූ නාට්‍යය වන්නේ,
(1) මකරා (2) ජනේලය (3) පව්කාරයෝ (4) අහස් මාලිගා

26. වේදිකා නාට්‍ය යනු සාමූහික කලාවකි, එය මෙහෙයවන්නා,
(1) නිෂ්පාදකය (2) අධ්‍යක්ෂය (3) පොතේගුරුය (4) ප්‍රේක්ෂකයාය.

27. නාට්‍ය දර්ශනයේ දී ඉතාම වැදගත් පිරිස වන්නේ
(1) අධ්‍යක්ෂවරයා (2) අනුෂංගික ශිල්පීන් (3) ප්‍රේක්ෂකයන් (4) සුබ ප්‍රාර්ථනා කරන්නන්

28. මෙහි නෘත්‍ය හා සම්බන්ධ වන්නේ
(1) වඩිග පටුන (2) කලගෙඩි නැටුම (3) ලී කෙලි නැටුම (4) පන්තේරු නැටුම

29. එදිනෙදා ජීවිතයේ ආයාසයකින් තොරව සිදු කරන්නේ
(1) නිර්මිත චලන වේ (2) ස්වාභාවික චලන වේ (3) තාලානුකූල චලන වේ (4) ආයාසාත්මක චලන වේ

30. කතන්දරය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ
(1) කතා කාලය සීමා සහිතයි (2) එහි නාට්‍යමය අවස්ථා බහුලයි
(3) එය අසා රස විඳිය හැකිය (4) සංවාද වල ව්‍යංගාර්ථ බහුලය

31. කායික සැහැල්ලුව මානසික සැහැල්ලුවට ද බලපායි. කායික සැහැල්ලුව ඇති කිරීමට සුදුසුම අභ්‍යාසය වනුයේ
(1) බුද්ධ ගජ්ජය කියවීම (2) දර්පණ අභ්‍යාස කිරීම
(3) හිම කන්ද දියවීම අභ්‍යාසය කිරීම (4) සෙන්ට් කුප්පියක් ආඝ්‍රහණය කිරීම

32. සූනියම් යක්ෂණියගෙ අවතාර තුන අන්තර්ගත වන්නේ
(1) රට යකුම ශාන්ති කර්මයේය (2) කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේය
(3) සන්නි යකුම ශාන්ති කර්මයේය. (4) සූනියම් යාගය ශාන්ති කර්මයේය.

**පහත රූප සටහන ඇසුරින් 33 - 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



33. මෙම නාට්‍යමය අවස්ථාව සහිත ශාන්තිකර්මය වන්නේ
(1) කොහොඹා කංකාරිය (2) සූනියම් යාගය
(3) සන්නියකුම (4) රටයකුම

34. මෙම ශාන්ති කර්මය ප්‍රසිද්ධ ප්‍රදේශයක් නොවේ.
(1) මාතර (2) බෙන්තර (3) දඹුල්ල (4) මිරිස්ස

35. ඉහත ශාන්ති කර්මයේ අරමුණක් නොවන්නේ
(1) ගර්භණියක හට දරු ප්‍රසූතිය යෙහෙන් සිදුවේවා කියා කරන ප්‍රාර්ථන ය ය
(2) උපන් දරුවාගේ ආරක්ෂාව සඳහා ය
(3) ස්ත්‍රියකට දරු උපතක් ලබාදීම සඳහා ය
(4) මංගර දෙවියන්හට කරන පූජාවක් ලෙසය

36. මෙම අවස්ථාව හඳුන්වනු ලබන්නේ
(1) වඩිග පටුන (2) අඹ විදමන (3) මී බන්ධනය (4) දොළහ පෙළපාලිය

37. මෙම ශිල්පීන් අතර චිත්‍රපට නළුවකු ලෙස ප්‍රසිද්ධියක් උසුලන්නේ
(1) සයිමන් නවගත්තේගම (2) බන්ධුල ජයවර්ධන
(3) සුගතපාල ද සිල්වා (4) එදිරිවීර සරච්චන්ද්‍ර

38. ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍ය ශිල්පිනියක් නොවන්නේ,
(1) මානෙල් ජයසේන (2) අමිතා රබ්බිඩිගල (3) සෝමලතා සුබසිංහ (4) නන්දා මාලනී

39. නළුවකුට බාහිරින් ලැබෙන අභිනය වන්නේ,
(1) ආංගික අභිනය (2) වාචික අභිනය (3) සාත්වික අභිනය (4) ආහාර්ය අභිනය

40. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණයක් නොවන්නේ
(1) මනමේ (2) සිංහබාහු (3) රත්තරං (4) දුන්න දූනු ගමුවේ

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

50 | S | II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

නම : ............................................ නාට්‍ය හා රංග කලාව - II කාලය : පැය 02යි.

සැලකිය යුතුයි.

I පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01. දික්තල කාලගෝල නාට්‍ය පෙළ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නාට්‍යයේ වර්තමාන නිර්මාණකරුවා කවුද? ලකුණු 02

(ii) මෙම නාට්‍යය මුල් වරට වේදිකා ගත කරන ලද්දේ කිනම් වර්ෂයේ ද? ලකුණු 02

(iii) මෙම නාට්‍යය නිර්මාණය සඳහා මූලාශ්‍ර කරගනු ලැබූයේ කිනම් කතා පුවතක් ද? ලකුණු 02

(iv) මෙහි අන්තර්ගත නාට්‍ය ධර්මී ලක්ෂණ 04ක් ලියන්න. ලකුණු 02

(v) ඉහත සඳහන් නිර්මාණ කරුවාගේ වෙනත් නිර්මාණ 02ක් සඳහන් කරන්න. ලකුණු 02

(vi) දික්තලාගේ චරිත ලක්ෂණ 02ක් සඳහන් කරන්න. ලකුණු 02

02. (i) ''රංග අභ්‍යාස'' යනු නිර්වචනය කරන්න. ලකුණු 03

(ii) ඔබ දන්නා රංග අභ්‍යාස 04ක් ලියන්න. ලකුණු 04

(iii) එයින් රංග අභ්‍යාස දෙකක් සිදු කරන ආකාරය පැහැදිලි කරන්න. ලකුණු 05

03. (i) නාට්‍යයක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න. ලකුණු 02

(ii) වේදිකා නාට්‍යයක සුවිශේෂී ලක්ෂණ 04ක් ලියන්න. ලකුණු 04

(iii) කතාන්දරයක සහ නාට්‍යයක සමාන අසමානතා පැහැදිලි කරන්න. ලකුණු 06

04. (i) රට යකුම ශාන්තිකර්මය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු 03ක් ලියන්න. ලකුණු 03

(ii) එහි උපත් කතාව කෙටියෙන් ලියන්න. ලකුණු 04

(iii) එහි නාට්‍යමය පෙළපාලි දෙකක් විස්තර කරන්න. ලකුණු 05

05. (i) නෘත්ත යන්න නිර්වචනය කරන්න. ලකුණු 02

(ii) නෘත්තවලට වඩා නෘත්‍ය වෙනස් වන්නේ කෙසේ ද? ලකුණු 04

(iii) වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන විවිධ කලා ප්‍රභේදයන් විස්තර කරන්න. ලකුණු 05

06. (i) ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් තිදෙනෙකු නම් කරන්න. ලකුණු 03

(ii) ඉහත (i) හි සඳහන් ශිල්පීන් විසින් නිර්මාණය කරන ලද නාට්‍ය නිර්මාණ 02 බැගින් සඳහන් කරන්න. ලකුණු 04

(iii) ඉහත (ii) හි සඳහන් එක් ශිල්පියෙකු පිළිබඳ ඇගයීමක් කරන්න. ලකුණු 05

07. (i) ''සමන් විසි හැවිරිදි තරුණයෙකි. තවම රැකියාවක් නොමැත. විවිධ රැකියාවන්ට ඉල්ලුම් කරයි. දිනක් ඔහු නිවසේ සිටින විට විදුලි සීනුව නාද වේ'' නාට්‍යෝචිත පෙළක් නිර්මාණය කරන්න. ලකුණු 12

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 50 | S | I - II |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

### නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (4) | 11. | (3) | 21. | (3) | 31. | (3) |
| 2. | (1) | 12. | (4) | 22. | (4) | 32. | (3) |
| 3. | (4) | 13. | (4) | 23. | (4) | 33. | (4) |
| 4. | (3) | 14. | (3) | 24. | (3) | 34. | (3) |
| 5. | (4) | 15. | (4) | 25. | (2) | 35. | (4) |
| 6. | (3) | 16. | (4) | 26. | (2) | 36. | (4) |
| 7. | (1) | 17. | (2) | 27. | (3) | 37. | (1) |
| 8. | (4) | 18. | (3) | 28. | (1) | 38. | (4) |
| 9. | (1) | 19. | (3) | 29. | (2) | 39. | (4) |
| 10. | (3) | 20. | (2) | 30. | (3) | 40. | (4) |

(1 5 40)

### II කොටස

01. (i) පුණ්‍යසේන ගුණසිංහ
(ii) 1975
(iii) උම්මග්ග ජාතකයෙහි කාලගෝල ප්‍රශ්නය
(iv)
- පොතේගුරෙකු සිටීම
- රිද්මයානුකූල චලන
- රිද්මයානුකූල භාෂාව
- ගායක කණ්ඩායමක් සිටීම
- ගායනය ප්‍රධාන වීම

(v) වෙස්සන්තර, කැකිල්ලේ, බන්ධන
(vi) චරිත ලක්ෂණ දෙකක් සඳහන් කර ඇත්නම්

02. (i) රංගය සඳහා යොදාගන්නා අභ්‍යාස
(ii) ශිථිල කර අභ්‍යාස, හඬ අභ්‍යාස, ශ්වසන අභ්‍යාස, දර්පන අභ්‍යාස ආදී වශයෙන්
(iii) විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03. (i) නළුවන් විසින් වේදිකාවක් මත සජීවීව ඉදිරිපත් කරන කලාවකි. සතර අභිනයෙන් යුක්ත වූ විට නාට්‍ය වේ. (භරතමුනි)
(ii)
- සජීවී කලාවකි.
- සාමූහික කලාවකි.
- පෙළ සාහිත්‍යයක් ඇත.
- ගැටුමක් තිබිය යුතුය. ආදී වශයෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(iii) කතාන්දරයක හා නාට්‍යයක සමාන අසමානතා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

04. (i) දරු සම්පත් ලැබීම, දරු ගැබ ආරක්ෂා කිරීම, ප්‍රසූතිය පහසු කිරීම
(ii) දීපංකර බුදුන් හා රිද්දි බිසව් සම්බන්ධ කතාව ලියා ඇත්නම්
(iii) නානුමුරය, කපුයක්කාරිය හා දරු නැළවිල්ල ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

05. (i) හුදු නර්තනයයි.
(ii) සතර අභිනය යොදා ගනී.
(iii) ප්‍රභේදයන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

06. (i) සයිමන්නවගත්තේගම, පරාක්‍රම නිරිඇල්ල, සුගතපාලද සිල්වා, බන්දුල ජයවර්ධන ආදී වශයෙන්
(ii) සයිමන් නවගත්තේගම - සුභ සහ යස, අහසින් වැටුන මිනිස්සු, කැලණි පාලම
බන්දුල ජයවර්ධන - බෙරහඬ, සකලජන
හෙන්රි ජයසේන - හුණුවටය, අපට පුතේ මගක් නැතේ, ජනේලය
(iii) එක් ශිල්පියෙක් පිළිබඳ ඇගයීමක් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

07. පිටපත ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.